# තනතුරු ඇබෑර්තු

## හෝමියෝපති වෛද්‍ය සභාව

හෝමියෝපති වෛද්‍ය සභාවේ පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. තනතුර : කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)**

**පුරප්පාඩු - 01**

**පත්වීමේ ස්වභාවය :** ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතයි.

**වැටුප් ක්‍රමය :** සේවා ගණයට අදාළ කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

MA1-1-2025- (රු. 46,220-10x540-7x 630 -4x890-20x1,190-රු.83,390)

*බාහිර අයදුම්කරුවන්:*

අධ්‍යාපන සුදුසුකම් :

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී
- (I) සිංහල
- (II) ගණිතය
- (III) ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ව තිබීම

(ඇ) තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම් : පරිගණක වදන් සැකසුම් පිළිබඳ මූලික දැනුම

*අභ්‍යන්තර අයදුම්කරුවන් :-*

(අ) ප්‍රාථමික ශ්‍රේණිය/ ශිල්පීය නොවන සහ අර්ධ ශිල්පීය සේවා ගණයන්හි පහත "ආ", "ඇ" සහ "ඉ" සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකි ය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී
- (I) සිංහල/ දෙමළ
- (II) ගණිතය
- (III) ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් සමත්ව තිබිය යුතු අතර ඉන් විෂයයන් තුනකටවත් සම්මාන සාමාර්ථ තිබිය යුතු ය.

(පරිගණක වදන් සැකසුම/ යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන් අතිරේක සුදුසුකම් වශයෙන් සලකා බලනු ඇත.)

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතු ය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු ය.

වයස :

අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වෙනත් :

සෑම ඉල්ලුම්කරුවෙක් ම,

- (i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
- (ii) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.
- (iii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

*අයදුම් කිරීමේ ක්‍රමවේදය :* තමා විසින් සකස් කරගන්නා ලද අදාළ කරුණු ඇතුළත් අයදුම්පතක් 2026.01.08 දිනට ප්‍රථම ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු යි.

*සැ. යු.* - ලිපියෙහි ඉහළ වම් කෙළවරෙහි "කළමනාකරණ සහකාර තනතුර සඳහා අයදුම් කිරීම" ලෙස දැක්විය යුතු යි.

**2.** **තනතුර : කාර්යාල සහායක (ප්‍රාථමික ශිල්පීය නොවන)**

පුරප්පාඩු - 04

**පත්වීමේ ස්වභාවය :** ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතයි.

**වැටුප් ක්‍රමය** : සේවා ගණයට අදාළ කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

PL1-2025 (රු. 40,500-10x450-10x490 -7x540-15x590-රු.62,530)

අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය යටත් පිරිසෙයින් විෂයයන් දෙකකින් (02) සමත් වී තිබිය යුතු ය.

වයස :

අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතු ය.

වෙනත් :

සෑම ඉල්ලුම්කරුවෙක් ම,

(iv) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

(v) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

(vi) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

*අයදුම් කිරීමේ ක්‍රමවේදය.-* තමා විසින් සකස් කරගන්නා ලද අදාළ කරුණු ඇතුළත් අයදුම්පතක් 2026.01.08 දිනට ප්‍රථම ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු යි.

*සැ. යු.* - ලිපියෙහි ඉහළ වම් කෙළවරෙහි "කාර්යාල සහායක තනතුර සඳහා අයදුම් කිරීම" ලෙස දැක්විය යුතු යි.

ලේඛකාධිකාරී *(වැ. බ.)*,
හෝමියෝපති වෛද්‍ය සභාව.

හෝමියෝපති වෛද්‍ය සභාව,
අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත, වැලිසර,
රාගම.

12 - 342